## නිමැවුමේ ස්වභාවය.

ළමා ඉතුරුම් ගිණුමකි.

## ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ.

- සාමාන්‍ය ඉතුරුම් ගිණුමට වඩා වැඩි 1% බෝනස් පොලියක්.
  (නවතම පොලී අනුපාත පිළිබඳ දැනගැනීම සඳහා,
  https://www.peoplesbank.lk/interest-rates/ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න)
- ගිණුමේ ශේෂයෙහි වර්ධනය මත ඉසුරු උදාන ගිණුම් හිමියන් වෙත සුවිශේෂී වූ ත්‍යාග රටාවක්.
  (වැඩිදුර තොරතුරු සඳහා https://www.peoplesbank.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න)
- දිනපතා ගණනය වන පොලිය මාසිකව ගිණුමට බැර වීම.
- ඉසුරු උදාන තෑගි වවුචර මගින් ගිණුම් විවෘත කිරීමට හැකිවීම සහ දැනට පවතින ගිණුමක් සඳහා ඉසුරු උදාන තෑගි වවුචර පත් බැර කිරීමට හැකිවීම.
- අලුත උපන් බිළිඳුන් වෙනුවෙන් සහ දරුවාට තිළිණ කිරීමට ඉසුරු උදාන ත්‍යාග වවුචර.
  (එම වවුචර මගින් ගිණුම් විවෘත කර ගැනීමට හෝ පවත්නා ගිණුමට බැර කිරීමට හැකිවීම.)

## ආරම්භක තැන්පතු හා ගාස්තු

- ඉසුරු උදාන ගිණුමක් විවෘත කිරීමේදී රු.250/- ක මූලික තැන්පතුවක් බැංකුව විසින් පිරිනමනු ලබයි.
- ගිණුමට අදාළ බදු, සේවා සහ අනෙකුත් ගාස්තු පිළිබඳ දැනගැනීම සඳහා බැංකුවේ නිල වෙබ් අඩවිය පරිශීලනය කරන්න.

## සුදුසුකම්

- වයස අවුරුදු 0-5 අතර ශ්‍රී ලාංකික පුරවැසි දරු දැරියන් සඳහා ඉසුරු උදාන ගිණුම විවෘත කළ හැකිය.
- මව/ පියා හෝ භාරකරු විසින් දරුවාගේ නමින් ඉසුරු උදාන ගිණුම් විවෘත කළයුතු වේ.

## ගිණුම විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර

- ඉසුරු උදාන ගිණුමක් විවෘත කිරීම සඳහා බැංකුව නිකුත් කරනු ලබන නිත්‍ය මැන්ඩේට්පත නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් ලියකියවිලි සමඟ ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය.

  - දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපත.
  - මව / පියා හෝ භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත.(NIC)
  - වලංගු ගමන් බලපත්‍රයේ පිටපත.(ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය.)
  - වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත.(ජාතික හැඳුනුම්පත හෝ වලංගු ගමන් බලපත්‍රය නොමැති අවස්ථාවක මෙය භාවිත කළහැකි නමුත් එහි ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය.)
  - ලිපිනය තහවුරු කිරීමේ ලියවිලි.(මැන්ඩේට්පතෙහි සඳහන් කරනු ලබන ලිපිනය උප්පැන්න සහතිකයේ සඳහන් ලිපිනයට වෙනස් වන්නේ නම් පමණක් මෙය ඉදිරිපත් කළ යුතුය)

**ප්‍රධාන නියම සහ කොන්දේසි.**

- ගිණුමට අදාළ සියලු නියමයන් සහ කොන්දේසි පිළිබඳ දැනුවත් වීම සඳහා ගිණුම විවෘත කිරීමේ මැන්ඩේට්පත පරිශීලනය කරන්න

මීට අදාළ නවතම තොරතුරු දැනගැනීමට ඔබට ආසන්න මහජන බැංකු ශාඛාව අමතා හෝ මහජන බැංකු නිල වෙබ් පිටුව වෙත පිවිසෙන්න.https://www.peoplesbank.lk/